VERITÉ
විදසුන්

Originally Published in: [, , ]

## විනිමය අනුපාත කළමණාකරණය: වෘත්තීයමය බව පරදවන දේශපාලනය

රටක ජනතාවගෙන් වැඩි පිරිසකට විනිමය අනුපාත කළමණාකරණය කිරීමෙහි ඇති ව්‍යාකූල බව වටහාගැනීමට නොහැකි ය. එසේ වුවත්, මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග, මානව සංවර්ධනය පෝෂණය කිරීම සඳහා අවශ්‍ය, ආර්ථික ස්ථාවරත්වය, වර්ධනය සහ ආර්ථිකයේ සමස්ථ සාර්ථකත්වය සැළකිය යුතු බලපෑමක් ඇති කරයි.

මෙම විදසුන මගින් පැහැදිලි කරන්නේ 2015 වෂර්ය තුළ සිදු කළ දේශපාලනික නිදෙර්ශයන් මගින් කෙතරම් දුරට විද්‍යානුකූලව සහ වෘත්තීයමයව සිදු කළ යුතු විනිමය අනුපාත කළමණාකරණය පරාජයට පත්වී ඇති ද යන්නයි. වෘත්තීයභාවය අවම වීම නිසා අත්විඳින්නට සිදුවන පාඩු, දූෂණය නිසා විඳින්නට සිදුවන පාඩුවලට වඩා වැඩි වෙනසක් නොවන අතරම, දූෂණය සහ වෘත්තීයභාවය අඩු වීම යන දෙකම එකිනෙක මත බැඳී පවතින්නටද ඉඩ ඇත. එබැවින්ම, මෙම විදසුන, තවමත් යහපාලනය සඳහා වන වැඩ සටහන විසින් නොසලකා හැර ඇති  වැදගත් අංශයක් වෙත අවධානය යොමු කරවයි.

### විනිමය අනුපාතිකය යනු කුමක් ද? එය වෙනස් වන්නේ ඇයි?

ශ්‍රී ලංකා රුපියල සහ ඇමරිකානු ඩොලරය අතර විනිමය අනුපාතිකය වනාහි ඇමරිකානු ඩොලරයක ශ්‍රී ලංකා රුපියල් අගය වන අතර, එය ශ්‍රී ලංකාව තුළ වන ඇමරිකානු ඩොලරය සඳහා වන ඉල්ලුම සහ සැපයුම මත රඳා පවතියි. ඇමරිකානු ඩොලරය සඳහා වන සැපයුම රට තුළ ඇති වන්නේ: අපනයන, විදේශවල සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ වැටුප්, සංචාරක ඉපැයීම්, විදේශ ආයෝජන, විදේශ ණය සහ රට තුළට විදේශ මුදල් ගලා එන වෙනත් ක්‍රම ආදියෙනි. සැපයුමෙහි වෙනසක් සිදු නොවී තිබියදී, ඇමරිකානු ඩොලරය සඳහා වන ඉල්ලුම ඉහළ යන විට සිදුවන්නේ ශ්‍රී ලංකා රුපියල්වලින් වන එහි අගය ඉහළ නැගීමයි. වෙනත් අයුරකින් පැහැදිලි කළහොත්, ඇමරිකානු ඩොලරයක් මිළට ගැනීම සඳහා අවශ්‍ය රුපියල් ප්‍රමාණය ඉහළ නගිමින් රුපියලෙහි වටිනාකම පහළ බසින්නට පටන් ගනියි.

### මහ බැංකුවේ කාර්යභාරය

මහ බැංකුව විසින් ඇමරිකානු ඩොලර ඇතුළු විදේශ මුදල් සංචිතයක් පවත්වා ගෙන යන්නේ  ආනයන සහ අනෙකුත් වැයකිරීම් සඳහාය. මෙම සංචිතයන් වෙළඳ පොළෙහි වන ඇමරිකානු ඩොලරය සඳහා වන ඉල්ලුම සහ සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට ද භාවිත කළ හැකි අතර එනිසාම විනිමය අනුපාතිකය සඳහා ද බලපෑම් කරයි. උදාහරණයක් ලෙස, මහ බැංකුවට සිය සංචිතයෙන් කොටසක් විකිණීම මගින් ඇමරිකානු ඩොලර සැපයුම ඉහළ දැමිය හැක. එසේ කිරීම මගින්, ඇමරිකානු ඩොලරයේ අගය පහළ දමා රුපියලෙහි අගය ඉහළ නංවාගත හැක. සංචිතයන් ඇත්තේ පහළ මට්ටමක නම්, ඇමරිකානු ඩොලර් මිළට ගැනීම පිණිසට මහ බැංකුවට සිදුවන අතර එය රුපියලේ අගය අවප්‍රමාණ කිරීමට හේතුපාදක වනු ඇත. වෙළඳ පොළ තුළ පැවතිය හැකි මෙවැනි කෙටිකාලින අස්ථාවරභාවයන් කළමනාකරණය කිරීම සඳහා මහා බැංකුවට මැදිහත්වී විනිමය අනුපාතිකය පාලනය කිරීමට සිදුවනු ඇත

කෙසේ වුවත්, වගකීම් විරහිත ලෙස මෙම මැදිහත් වීම භාවිතා කරමින්, දිගුකාලීනව රඳවා ගත හැකි නොවන කෘතිම විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාමද සිදු කළ හැක. දශක කිහිපයක් තිස්සේ, මෙවැනි වගකීම් විරහිත මැදිහත් වීම් සහ ඒ පදනම් කොට සිදුවුණු, වෙළඳ පොළ කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ, ක්ෂණික, තියුණු විනිමය අනුපාත වෙනස්වීම් මෙරට තුළ ද දක්නට ලැබිණි. මෙම රටාව 2015 දී වෙනස් කෙරෙනු ඇතැයි බලපාරොත්තු වූ නමුත් එය සිදු වූයේ නැත.

### දේශපාලනික **පරමාර්ථ** වෙනුවෙන් විනිමය අනුපාත ස්ථාවරව තැබීම

2015 මැතිවරණ දෙකක් පැවති වසරකි. ජනාධිපතිවරණය ජනවාරි මස 08 වැනි දින පැවති අතර මහ මැතිවරණය පැවතියේ අගෝස්තු 17 වැනි දින ය. ශ්‍රී ලංකාව තුළ පවතින මහජන විශ්වාසයක් වන්නේ, රුපියලෙහි අගය පහළ බැසීම දුවර්ල ආර්ථිකයක් ඇති බව පෙන්නුම් කරන්නක් වන අතරම රුපියලෙහි අගය ඉහළ නැගීම ශක්තිමත් ආර්ථිකයක දශර්කයක් වන බවයි. මාධ්‍යය විසින් සිදු කරන දුවර්ල ආර්ථික වාතර්ාකරණයද මෙම මහජන මතය ඇති කිරීමට බලපාන සාධකයකි. ශ්‍රී ලංකාවේ පරිභෝජනහි

වැදගත් අංශක් වන ආනයනික භාණ්ඩ වෙනුවෙන් වැය කරන ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් රුපියල අවප්‍රමාණ වීම, උද්ධමනය වෙත සැළකිය යුතු බලපෑමක් සිදු කරයි. මැතිවරණ ආසන්න සමයේ දී මෙම කරුණු දෙකම විනිමය අනුපාතිකය කෙරෙහි දේශපාලනික බලපෑම් එල්ල කිරීමට හේතු වෙයි.

විනිමය අනුපාතිකය අස්ථාවරත්වය පාලනය කිරීම පිණිස පදනමකින් යුතුව කටයුතු කරනු වෙනුවට, වගකීම් විරහිත ලෙස රුපියලේ අගය පාලනය කිරීම මගින්, වත්මන් ආණ්ඩුවේ දේශපාලනික උවමනාවන් සඵල කිරීම සඳහා මහ බැංකුව කෙසේ කටයුතු කර ඇති දැයි 2015 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ විනිමය අනුපාතික අගයන් පෙන්වා දෙයි.

අගෝස්තු මහ මැතිවරණයෙන් පසු, එහි පැවති අගය ඔස්සේ දිවෙන සුගම මාවතක ගමන් කරනු වෙනුවට, තිගැස්සෙන සුළු තියුණු වෙනසක් පෙන්වමින් ඇමරිකානු ඩොලරයේ අගය වෙනස් වන ආකාරය පළමු රූප සටහන 1 පෙන්වා දෙයි. රූප සටහන 2 පෙන්වන්නේ අගෝස්තු මස මහ මැතිවරණය කෙළවර වී නව ආණ්ඩුව බිහිවීම තෙක් (ඉන් ද තව මසක් ගතවන තෙක්), මුල් මාස අට තුළ මහ බැංකුව ඉතා වේගයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.8ක් විකුණා දමමින් විනිමය අනුපාතිකය කෘතිමව රුපියල් 133 සහ 134 අගයක් තුළ රඳවා ගන්නට කටයුතු කළ ආකාරයයි.

විනිමය අනුපාත විකෘති කිරීම පිණිස වන ආර්ථික අවශ්‍යතා

රුපියල අධි තක්සේරු කර පවත්වා ගැනීමට හේතු සළසන ආර්ථික අවශ්‍යතා ද පවතියි. උදාහරණයක් ලෙස, ඇමරිකානු ඩොලර් ණය ගෙවීමට අවස්ථාව පැමිණි විට ඒ වෙනුවෙන් රජයට ඇමරිකානු ඩොලර් මිලට ගැනීමට සිදු වෙයි. මෙවැනි අවස්ථාවකදී අධිතක්සේරුගත විනිමය අනුපාතිකයක් තිබීම තුළින් විචල්‍යත් යම් තරමකට අඩු කළ හැක. එනමුත්, විනිමය අගය නිසි පරිදි පවත්වාගෙන යා නොහැකි විට ආර්ථික වාසි ලැබීම ප්‍රශ්නකාරී වන්නේ, අධිතක්සේරුගත විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාම සඳහා ඇමරිකානු ඩොලරය අඩු මිලකට විකිණීම හේතුවෙන් සුවිශේෂ පාඩු රැසකට මුහුණදීමට සිදුවීම හේතුවෙනි.


දේශපාලනයට පෙර ආර්ථිකය

විනිමය අනුපාතිකය මෙහෙයවීම සහ එය පවත්වාගෙන යෑම මගින් පෙන්වන්නේ මහ බැංකුව දේශපාලනික නිදේශ මත කටයුතු කරන බවයි.


විනිමය අනුපාතිකය කළමණාකරණයේ මෙවැනි බිඳවැටීම් විශාල, සැඟවුණු වැයවීම් වෙත මග පාදයි. මෙවනි ප්‍රතිපත්ති නිසා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමේ අවධානම සහ පිරිවැය ඉහළ දමන අතර, එය විදේශ ආයෝජකයින් මෙරට ආයෝජනයට පසුබට වීමට හේතුවක් වනු ඇත. එසේම, පෙරදැක්මක් කළ නොහැකි නිසාත්, බලාපොරොත්තු නොවන හදිසි වෙනස්කිරීම් නිසාත්, විදේශ වෙළඳාම මත ක්‍රියාත්මක වන සියළු අංශයන්ට ඒ හේතුවෙන් පාඩු විඳීමට සිදුවනු ඇත.

ආර්ථිකය යහපාලනයකට ලක්ව තිබුණේ නම් සහ පාලර්මේන්තුව වගකීම් සහගතව කටයුතු කළේ නම් සිදුවිය යුතුව තිබුණේ, විනිමය අනුපාතිකය වෘත්තීමය ලෙස කළමණාකරණය කිරීමට අසමත්වීම පිළිබඳ පාලර්මේන්තුවට හා මහජනතාවට නිදහසට කරුණු දක්වන ලෙස මහ බැංකුවට දන්වා සිටීමයි.

ප්‍රගතිය සෙමින් වුවත්, දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා වන වැඩපිළිවෙලක් වත්මනෙහි දකින්නට ඇත. කෙසේ නමුත්, මෙම විදර්ශනය පැහැදිලි කර දෙන්නේ රාජ්‍ය ආයතන සිය ක්‍රියාකාරකම්වලදී වෘත්තීමය ලෙස කටයුතු කරන බවට මහජනතාවට සහ පාලර්මේන්තුවට වග වන සුළු මට්ටමක් දක්වා යහපාලන න්‍යාය පත්‍රය පුළුල් කළ යුතු බවයි.




**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව: සතිපතා ආර්ථික දර්ශක**




**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව: සතිපතා ආර්ථික දර්ශක**

**වෙරිටේ පර්යේෂණ ආයතනය යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජන මාධ්‍යය විෂයයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පෂර්දයකි. ප්‍රතිචාර ඇගයේ. විද්‍යුත් තැපැල:** publications@veriteresearch.org